www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය
සසප/ ලෝසවෙඅ ගිම්හාන පාසල 2005

**පස් වන දේශනය**

# ප්‍රථම ලෝක සංග්‍රාමය: ධනවාදයේ බිඳවැටීම

## World War I: The breakdown of capitalism

**පලමුවන කොටස**

**නික් බීම්ස් විසිනි.**
**2005 සැප්තැම්බර් 21**

*2005 අගෝස්තු මස 14 වැනි දා සිට 20 වැනි දා දක්වා මිචිගන්හි ඈන් ආර්බර්හි දී පැවැත්වුනු සමාජවාදී සමානතා පක්ෂයේ/ලෝසවෙඅ ගිම්හාන පාසැලෙහි දී ලෝක සමාජවාදී වෙබ් අඩවියේ කර්තෘ මන්ඩල සාමාජික සහ ඕස්ට්‍රේලියාවේ සමාජවාදී සමානතා පක්ෂයේ ජාතික ලේකම් නික් බීම්ස් විසින් පවත්වනු ලැබූ " ප්‍රථම ලෝක සංග්‍රාමය: ධනවාදයේ බිඳවැටීම" යන දේශනයේ පලමුවන කොටස යි මේ. මේ දේශනය කොටස් පහකින් පල කෙරේ.*

*මෙය පාසැලෙහි පැවැත්වුනු පස් වන දේශනය යි.*

### *War and the International* යුද්ධය හා ජාත්‍යන්තරය ගැන ට්‍රොට්ස්කි

පලමුවන ලෝක යුද්ධය පුපුරායාමට යන්තම් තෙමසකට පසු 1914 නොවැම්බරයේ දී ලියොන් ට්‍රොට්ස්කි ගෝලෝස් පුවත්පතෙහි කොටස් වසයෙන් පල වීම ආරම්භවූ *යුද්ධය හා ජාත්‍යන්තරය* නම් සිය කෘතියේ යුද්ධය පිලිබඳව අති විශේෂතම වූ ද දූරදර්ශී වූ ද විශ්ලේෂනයක් සම්පාදනය කලේය. එ සමයේ දී සියල්ලටමත් වඩා ලෙනින් හා රෝසා ලක්සම්බර්ග් ද ඇතුලත් අනෙක් සියලු මාක්ස්වාදී නායකයන් සේ ම ට්‍රොට්ස්කි ද අන්තර් සම්බන්ධිත ප්‍රශ්න දෙකක් ගැන උනන්දු විය.

1. යුද්ධයේ මූලාරම්භය හා ධනවාදයේ ඓතිහාසික සංවර්ධනයට එහි සම්බන්ධතාවය.
2. ජාතික ආරක්ෂාව හේතුවක් කොට ගනිමින් "තමන්ගේ ම" පාලක පන්තීන්ට සහයෝගය දීම් වස් සිය පක්ෂ සම්මේලනයන්හි තීන්දු ප්‍රතික්ෂේප කලා වූ දෙවැනි ජාත්‍යන්තරයේ නායකයන්ගේ අන් සියල්ලටමත් වඩා ජර්මානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදයේ නායකයන්ගේ පාවාදීම හමුවේ ජාත්‍යන්තර කම්කරු පන්තිය සඳහා මූලෝපායක් වර්ධනය කිරීම.

ට්‍රොට්ස්කිට අතිශයින්ම හදිසි න්‍යායික කර්තව්‍යය වූයේ සියලු මූලෝපායික හා උපායික ප්‍රතිෂ්ඨාවන් රඳාපැවතියා වූ ධනේශ්වර ලෝක ආර්ථිකයේ ඓතිහාසික සංවර්ධනය තුල, යුද්ධය පුපුරායාම පිහිටා ඇති අයුරු නිර්නය කර ගැනීම ය.

සමාජ විප්ලවයේ යුගය අවතීර්න වන්නේ "සමාජයේ ද්‍රව්‍යමය නිෂ්පාදන බලවේග, පවත්නා නිෂ්පාදන සම්බන්ධතා සමග ඝට්ටනයට එලඹුනු කල්හි" බව මාක්ස් පැහැදිලි කොට තිබුනි. මෙම ලක්ෂ්‍යයේ දී මෙම සම්බන්ධතාවෝ නිෂ්පාදන බලවේගයන්ගේ සංවර්ධනයෙහි රූපාකාරයන්හි සිට ඒවායේ විලංගු බවට පත් කරනු ලබති.

යුද්ධයේ අර්ථභාරය රඳා පැවැතුනේ මෙහි ය. පෙර සිව් දශකයෙහි ඓතිහාසිකව පෙර නොවූ විරූ ආර්ථික සංවර්ධනයකට තුඩුදුන්නා වූ - වචනයේ පරිසමාප්තියෙන් ම නිෂ්පාදන බලවේගයන්හි පිම්ම සඳහා පිනුම් පිත්ත වී යයි ට්‍රොට්ස්කි වරෙක සඳහන් කල - සමස්ත ජාතික රාජ්‍ය පද්ධතිය නිෂ්පාදන බලවේගවල තවදුර තර්කානුකූල සංවර්ධනයකට විලංගුවක් බවට පත්ව තිබුනේය යන කාරනය යුද්ධය විසින් නිවේදනය කරන ලදී. මනුෂ්‍ය වර්ගයා සමාජ විප්ලවයේ අවධියට ප්‍රවිෂ්ටව තිබුනි.

"ධනවාදය විසින් විකාශනය කර ගැනුනු, නිෂ්පාදන බලවේග ජාතිය හා රාජ්‍යයේ සීමා ඉක්මවා වැඩී ගොස් ඇත" යි ට්‍රොට්ස්කි සිය විශ්ලේෂනයේ පලමු වැකිය තුල ම ලිවී ය. "වත්මන් දේශපාලන ආකෘතිය වන ජාතික රාජ්‍යය, මෙම නිෂ්පාදන බලවේගයන්ගේ පල නෙලාගැනීම සඳහා පටු වැඩි ය. එබැවින් අපගේ ආර්ථික පද්ධතියෙහි ස්වභාවික ප්‍රවනතාවය වන්නේ රාජ්‍යයේ සීමාවන් ඉක්මවා යෑමට උත්සාහ කිරීමයි. ගොඩබිම ද සාගරය ද ඇතුලත් සමස්ත ලෝක ගෝලයේ ම මතුපිට මෙන් ම අභ්‍යන්තරය ද එහි විවිධ කොටස් වෙන් කල හැකි වන පරිදි එකිනෙකට

සම්බන්ධ කරන්නා වූ එකම ආර්ථික වැඩපලක් බවට පත්ව ඇත.[1]

දන් ගෝලීය කරනය ලෙස විස්තර කෙරුනු මෙම ක්‍රියාවලිය එවකදී ට්‍රොට්ස්කිට දුර විහිදෙන වැදගත්කමක් දුටී ය. මනුෂ්‍ය වර්ගයාගේ නැගී ඒම එක් මානයකට සිඳවිය හැකි නම්. ඒ සහතිකෙන් ම ශ්‍රමයේ ඵලදායිතාව යි; එහි වර්ධනය මානව ශිෂ්ටාචාරයේ ඉදිරි ගමන සඳහා ද්‍රව්‍යමය පදනම සම්පාදනය කරයි. ශ්‍රම ඵලදායිතාවයේ ඉහල නැගීම, දේශීය, ප්‍රාදේශීය හා භූගෝලීය පදනමක නිෂ්පාදන බලවේගයන් ප්‍රසාරනය වීම සමග නොවෙන්කල හැකි සේ බැඳී පවතී. 19 වැනි සියවසේ අවසන් දශකයන්හි නිෂ්පාදන බලවේගයන්ගේ සංවර්ධනය සීඝ්‍රතාවයකින් යුතුව පෙරට ගෙන යාහැකි වූයේ ප්‍රසාරනය වන ධනේශ්වර බලවතුන්ගේ අනුග්‍රහය යටතේ ය.

එහෙත් එන්ට එන්ටම පරස්පරවිරෝධී වූ ක්‍රියාවලිය ට්‍රොට්ස්කි මෙසේ පැහැදිලි කලේ ය.

ලොව ම වෙලා ගත් ආර්ථික පද්ධතිය සෑම රටක ම ධනේශ්වරයේ ලාභ අවශ්‍යතාවන් යටතට ගැනීම සඳහා ධනේශ්වර රාජ්‍යයන් අරගලයකට අවතීර්න වූහ. අධිරාජ්‍යවාදයේ දේශපාලනය පෙන්නුම් කර ඇත්තේ අන් කවරකටත් වඩා 1789-1815, 1848-1859, 1864-66 හා 1870 දී සංග්‍රාමයන් තුලින් නිර්මානය කරන ලද පැරනි ජාතික රාජ්‍යයන් ආර්ථික සංවර්ධනයෙහි ලා දන් නොඉවසියහැකි බාධකයක් බවට පත්වෙමින් යල්පැන ඇති බවයි. වර්තමාන යුද්ධය පතුලෙහි පිහිටියේ ජාතියේ හා රාජ්‍යයේ දේශපාලන ආකෘතියට එරෙහි නිෂ්පාදන බලවේගයන්ගේ කැරැල්ලයි. එහි අර්ථය ස්වාධීන ආර්ථික ඒකකයක් ලෙස ජාතික රාජ්‍යයෙහි බිඳවැටීම යි.[2]

මානව වර්ගයාට අභිමුඛ කරවූ කර්තව්‍යය මුලුමනින් ම ජාතික රාජ්‍ය රාමුව ඉක්මවා වැඩී ගිය නිෂ්පාදන බලවේගයන්ගේ සුසංගත වර්ධනය සහතික කර ලීම යි. කෙසේ වුවද විවිධාකාර ධනේශ්වර ආන්ඩු මෙම ගැටලුව විසඳීමට බලාපොරොත්තු වූයේ "ඥානානන්විත, මානවවාදයේ සියලු නිෂ්පාදකයන්ගේ සංවිහිත සහයෝගයෙන් නොව, මෙම යුද්ධයේ දී මහා බලවතුන්ගේ සිට ලෝක බලවතෙකු බවට පරිවර්තනය වූ ජයග්‍රාහී රටෙහි ධනපති පන්තිය විසින් ලෝක ආර්ථික ක්‍රමය සූරාකෑම තුලින් ය."[3]

යුද්ධය, ස්වාධීන ආර්ථික ඒකකයක් ලෙස ජාතික රාජ්‍යයෙහි ඇද වැටීම පමනක් නොව ධනේශ්වර ආර්ථිකයෙහි ප්‍රගතිශීලී ඓතිහාසික ක්‍රියාකලාපයේ ද අවසානය සනිටුහන් කල බව ට්‍රොට්ස්කි අවධාරනය කලේ ය. පුද්ගලික දේපල ක්‍රමය සහ එහි විපාකය ලෙස වෙලඳපොල සහ ලාබය සඳහා අරගලය ශිෂ්ටාචාරයේ මුලු මහත් අනාගතයටම තර්ජනය කරයි.

"ලෝක ආර්ථිකයේ අනාගත සංවර්ධනය ධනේශ්වර පදනමක තැබීමේ අර්ථය වනාහි, ඒ සමග ඇති එකම මූලාශ්‍රය වන පෘතුවියෙන් ධනපති සූරාකෑම සඳහා තවතවත් අලුත් ක්ෂේත්‍රයන් අත් පත් කර ගැනීමට කෙරෙන නොනවතින අරගලයකි. මිලිටරිවාදයේ ධජය යටතේ මානව ආර්ථිකයේ මූලික මූලධර්ම උල්ලංඝනය කෙරෙන මංකොල්ලය සහ විනාශය කැටුව එයි. ජාතික සහ රාජ්‍ය බෙදීම මගින් නිර්මිත ව්‍යාකූලතාවයට එරෙහිව පමනක් නොව, වර්තමානයේ ම්ලේච්ඡ අසංවිධානාත්මක බවකට සහ අවුලකට පරිවර්තනය කෙරී ඇති ධනවාදී ලෝක ආර්ථික සංවිධානයට එරෙහිව ද ලෝක නිෂ්පාදනය කැරලි ගසයි. 1914 යුද්ධය, එයට ම ආවේනික වූ ප්‍රතිසතිතාවන්ගෙන් විනාශ කරනු ලැබූ ආර්ථික පද්ධයක් තුල සිදු වූ සුවිශාලතම බිඳවැටීමයි."[4]

"බිඳවැටීම" යන පදය යොදා ගැනීම අහඹුවක් නොවී ය. එය, සිද්ධීන් මගින් මාක්ස්ගේ "බිඳවැටීමේ න්‍යාය" ප්‍රතික්ෂේප වී ඇති බවට ඔහුගේ අවධාරනය කිරීම මගින් මාක්ස්වාදී ක්‍රියාමාර්ගයයේ විප්ලවවාදී හදවත ඉවත් කිරීමට උත්සාහ කල බර්න්ස්ටයින්ගේ සංශෝධනයන් ගැන කෙරුන සෘජු සඳහනකි.

යුද්ධයේ වෛෂයික ඓතිහාසික වැදගත්කම පිලිබඳව මෙම විශ්ලේෂනය, කම්කරු පන්තිය සඳහා ඉදිරිදර්ශනයක් වර්ධනය කිරීමෙහි ලා ක්ෂනික ඇඟවුම් ගැබ්කරගත්තේ ය. දෙවෙනි ජාත්‍යන්තරයේ ජාතිකවාදී හා අනුක්‍රමිකවාදී දේශපාලනයෙන් සම්පූර්නයෙන් බිඳී වෙන් වීමක් ඒ සඳහා අවශ්‍ය විය. සමාජවාදය සඳහා අරගලය යලි ඇරඹීමට හැකි වූ විගසම කම්කරු පන්තියේ ප්‍රථම කර්තව්‍යය ජාතික ආරක්ෂාව බව කියා සිටි අයට එරෙහිව ට්‍රොට්ස්කි පැහැදිලි කලේ "ආර්ථික සංවර්ධනයේ ප්‍රධාන බාධකය බවට පත්ව ඇති නටඹුන් වී ඇති සහ යල්පිනූ ජාතික 'පීතෘභූමිය' ආරක්ෂා කිරීමේ කිසිදු ඕනෑකමක් කම්කරු පන්තියට නැති" බවයි.

ට්‍රොට්ස්කිගේ සියලු විශ්ලේෂනයන් හරහා දිවයන මධ්‍යම තේමාව වූයේ අධිරාජ්‍යවාදයේ වර්ධනය හා යුද්ධය පුපුරා යාම, මනුෂ්‍ය ශිෂ්ඨාචාරයේ සංවර්ධනයෙහි නව අවධියක් සලකුනු කරන බව අවධාරනය කිරීමයි.

"ජාතියේ හා රාජ්‍යයේ විලංගුවලට හිරවීමෙන් නිදහස් වූ, ලෝකපරිමාන මානව ආර්ථිකයක් ගොඩනැගීමට ඉවහල්වන, ආර්ථික සංවර්ධනයේ ප්‍රගතිශීලී ප්‍රවනතාවක කොල්ලකාරී ප්‍රකාශනයක් 'අධිරාජ්‍යවාදය' තුලින් නියෝජනය කෙරෙන බව" ඔහු ලිවී ය. "අධිරාජ්‍යවාදයට ප්‍රතිවිරුද්ධව ඉදිරිපත් කරන නග්න ස්වරූපයේ ජාතික අදහස බෙලහීන පමනක් නොව ප්‍රතිගාමී ද වෙයි: එය මනුෂ්‍ය වර්ගයාගේ ආර්ථික ජීවිතය ජාතික සීමිතභාවයේ රෙදිකඩින් එතීම කරා ආපසු ඇද දමයි.[5]

අධිරාජ්‍යවාදයේ වර්ධනය හා යුද්ධය පුපුරා යාම නව ආකාරයේ සමාජ සංවිධානයන් හැඩ ගැසෙමින් උපත ලැබීමට අරගලයේ යෙදී සිටීම කාරනයේ පරස්පර විරෝධී ප්‍රකාශනයකි.

ධනවාදයේ "අධිරාජ්‍යවාදී ව්‍යාකූලත්වයට" මුහුන දිය හැකි එකම මාර්ගය ලෝක ආර්ථිකය සමාජවාදී ලෙස සංවිධානය කිරීම දවසේ ප්‍රායෝගික ක්‍රියාමාර්ගය ලෙස සලකා එයට විරුද්ධ වීමෙනි. යුද්ධය, ධනවාදය එහි සංවර්ධනයේ කූටප්‍රාප්තියේ දී නොවිසඳියහැකි ප්‍රතිරෝධයන් විසඳීමට උත්සාහ කරන ක්‍රමවේදයයි. තමන්ගේ විධික්‍රමයන්, එනම්, සමාජ විප්ලවයේ විධික්‍රමයෙන් නිර්ධන පන්තිය මෙම විධික්‍රමයට එරෙහි විය යුතු ය."[6]

යුද්ධය ආරම්භයේ පටන් ම ධනපති පාලක පන්තීන් සතු දෘෂ්ටිමය හා දේශපාලන සම්පත් සියල්ලම එක් අත්‍යාවශ්‍ය කාරනයක් වෙත යොමු කර තිබූ බව අතිශයෝක්තිය පිලිබඳ බියකින් තොරව කිව හැකිය. එනම්, පලමු ලෝක සංග්‍රාමයේ පිපිරීයාමෙන් අර්ථවත් කරන්නේ ධනවාදී පද්ධතියේ ඓතිහාසික බංකොලොත්කම බව සහ මානව වර්ගයාගේ නිෂ්පාදන බලවේගයන්හි තර්කානුකූල සංවර්ධනය ඉදිරියට ගැනීම සඳහා ජාත්‍යන්තර සමාජවාදය මගින් එය විස්ථාපනය කිරීමේ අවශ්‍යතාවය පෙන්වා දුන් මාක්ස්වාදී විශ්ලේෂනය ප්‍රතික්ෂේප කිරීම ය.

ගැටුමේ උනුසුම මධ්‍යයේ ම ධනේශ්වර දේශපාලඥයෝ සෑම පැත්තකින් ම, යුද්ධයේ වගකීම සිය එදිරිවාදීන් මත තැබීමට උත්සාහ කලහ. බ්‍රිතාන්‍ය දේශපාලනඥයින්ට යුද්ධය, බෙල්ජියමේ මධ්‍යස්ථභාවය උල්ලංඝනය කිරීමට ජර්මනිය මෙහෙයවනු ලැබූ එහි ආක්‍රමනකාරිත්වයේ ප්‍රතිඵලය විය. ජර්මානු පාලක පන්තීන්ට එම ප්‍රශ්නය, ලෝක ආර්ථික පර්යාය තුල ජර්මනියේ සුජාත ස්ථානය ප්‍රතික්ෂේප කිරීමෙහි ලා අනෙකුත් බලවතුන්ගේ උත්සාහයන් ද, රුසියානු ම්ලේච්ඡත්වය ද විය. ප්‍රන්ස ධනේශ්වරයට සහ සාර් රාජධානිය සමග ප්‍රන්සයේ සන්ධානය තිබිය දී ම ජර්මානු ආක්‍රමනකාරිත්වයට එරෙහිව කල සංග්‍රාමයක් විය. යුද්ධාවසානයේ දී ජයග්‍රාහකයෝ එම ගිනිමැලයේ වගකීමෙන් තමන් නිදහස් වීම සඳහා ජර්මනිය මත වගකීම පටවන "යුද වරදකරු" වගන්තිය වර්සේල්ස් ගිවිසුමට ඇතුලත් කිරීම මගින් එම ගිනි මැලයේ වගකීමෙන් තමන් නිදොස් වීමට උත්සාහ කලහ.

එක්සත් ජනපදයේ ජනාධිපති බවට පත් වූ ඉතිහාසඥ වුඩ්රෝ විල්සන් ට අනුව රහසිගත රාජ්‍යතාන්ත්‍රික කටයුතු, ඊනියා බල තුලනය හා සන්ධානයන් මත පදනම් වූ 19 වැනි සියවසේ දේශපාලන ක්‍රමවේදයන් මත යුද්ධයේ වගකීම පැවරීමෙන් විල්සන්ගේ විශ්ලේෂනය යම් දුරකට අභිප්‍රේරනය වූයේ, ධනවාදය යුද්ධයේ කම්පනයට මුහුන දීමේ දී ප්‍රජාතන්ත්‍රවාදය හා නිදහසට ආයාචනය කරන නව ඉදිරි දර්ශනයක් වර්ධනය කල යුතුවේ යයි ඔහුට පැවති වැටහීමෙන් ය. අර්ථභාරී කාරනය නම් ප්‍රතිසංවිධානය කිරීමේ පශ්චාත් යුද්ධ පර්යාය හා ලෝකය ප්‍රජාතන්ත්‍රවාදය සඳහා සුරක්ෂිත තැනක් බවට පත් කිරීමේ අවශ්‍යතාවය හඳුනගෙන ඇමරිකානු උත්සාහය මත පදනම් කරන සුප්‍රකට කරුනු දාහතර, සකස් කරමින් සිටිය දී විල්සන් ට්‍රොට්ස්කිගේ යුද්ධය හා ජාත්‍යන්තරය නම් පොත් පිංච අධ්‍යයනය කලේ ය.

යුද්ධය අවධියේ බ්‍රිතාන්‍යයේ අගමැති ලොයිඩ් ජෝර්ජ්, යුද්ධයෙන් ඉක්බිතිව එම අග්නි ජාලාව පිලිබඳ චෝදනාවෙන් සියලු ධනපති දේශපාලනඥයන් නිදහස් කර ගැනීමේ උත්සාහයක නිරත විය. යම් ආකාරයක පටලැවිල්ලක් සහිතව එය ප්‍රමාද වී හිස එසැවී ය. 1914 ජුලියේ දී "රාජ්‍ය ප්‍රධානීන් කිසිවෙක් යුද්ධය බලාපොරොත්තු නොවූ" බව ඔහු පැහැදිලි කලේ ය. එය ඔවුන් ලිස්සා හෝ පය පැකිලී ඇද වැටීමක් වැනි දෙයක් විය. මෙම තර්කය යුද්ධය පිලිබඳ සිය මතක සටහන්වල ඔහු යලිත් සඳහන් කර තිබේ. "ජාතීන් වටහාගැනීමක හෝ සන්තාපයක සලකුනකුදු නොමැතිව යුද්ධය නමැති පැහෙන කල්දේරම් ගැට්ට මතින් ඒ තුලට ලුහුටා ගියේ ය. කිසිවෙකුටත් යුද්ධය අවශ්‍ය නොවී ය."[7]

දශක නමයකටත් වැඩි කලක් ගතවූ තැන, ප්‍රථම ලෝක සංග්‍රාමයේ සම්භවය පිලිබඳ ප්‍රශ්නයට තවමත් ක්ෂනික වැදගත්කමක් හා අදාලත්වයක් ඇත. හේතුව සොයා ගැනීම අපහසු නැත.

ඇමරිකානු ඉතිහාසඥයෙකු හා විදෙස් පිලිවෙත් විශ්ලේෂකයකු වූ ජෝජ් එෆ්. කෙනත් සඳහන් කල ආකාරයට යුද්ධය "මෙම සියවසේ දූවැන්තම ව්‍යසනය" විය. රැල්ලක් පසුපස තවත් රැල්ලක් වසයෙන් නොකඩවා තරුනයන් (සමහරෙක් යාන්තම් ලමා විය පසු කල අයයි) යුද අගල් තුල මිනීමැරීම සඳහා යලි යලිත් පිටත්කර හැරුනේ මිලියන ගනනකගේ මරනයේ ද ම්ලේච්ඡත්වයේ ද යුගයක් සලකුනු කරමිනි.

මෙම ව්‍යසනයේ මූලයන් කවරේ ද? ඒවා ධනේශ්වර නිෂ්පාදන ක්‍රමය තුල මුල්බැස තිබුනේ ද? එසේ නම් ධනවාදය අහෝසි කිරීමේ අවශ්‍යතාවය මෙ මගින් තහවුරු නොකරන්නේ ද? මෙම ප්‍රශ්නයන් එකකට වත් ඒවායේ වැදගත්කම අභිමි කර ගෙන නැත. හේතුව සුප්‍රකට ප්‍රන්ස ඉතිහාසඥ එලී තැලිවිගේ මෙම වචන තුල ගැබ්වෙයි. "1914-18 ලෝක අර්බුදය යුද්ධය පමනක් නොව - 1914 යුද්ධය - විප්ලවයක් ද - 1917 විප්ලවය - විය." විප්ලවය සරලව ම යුද්ධයේ නිෂ්පාදනයක් නොවී ය. ධනේශ්වර පාලක පන්තීන් විසින් හෙලනු ලැබූ ම්ලේච්ඡත්වයෙන් ඉවතට, මානව වර්ගයාගේ වැඩි වර්ධනය සඳහා ඉදිරි මාවතක් විවෘත කර ගැනීමේ දී

එහි නායකත්වය විසින් විප්ලවය පරිකල්පනය කරන ලදී.

සටහන්:-

1. *War and tha International,* වෝ ඇන්ඩ් ද ඉන්ටර්නැෂනල් (කලම්බුः යංග් සෝෂලිස්ට් පබ්ලිකේෂන්ස්, 1971; පි. vii)

2. එම. පි. vii.

3. එම. පි. vii.

4. එම. පි. viii.

5. "Imperialism and the National Idea" in Lenin's struggle for a Revolutionary International ලෙනින්ගේ විප්ලවවාදී ජාත්‍යන්තරයක් සඳහා අරගලය, අධිරාජ්‍යවාදය සහ ජාතික සංකල්පය නිව් යෝර්ක් පාත් ෆයින්ඩර් ප්‍රෙස් පි. 369-70)

6. *War and tha International,* වෝ ඇන්ඩ් ද ඉන්ටර්නැෂනල් (කලම්බුः යංග් සෝෂලිස්ට් පබ්ලිකේෂන්ස්, 1971; පි. vii-x

7. *Cited in Hamilton and Hearing Decisions for War 1914-17*, කේම්බ්‍රිජ්, 2004, පි. 19)

© www.wsws.org